# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,988 - 2016 ඔක්තෝබර් මස 07 වැනි සිකුරාදා - 2016.10.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1788 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1789 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.* - එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2016 ජුනි මස 24 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 ඔක්තෝබර් මස 28 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 ඔක්තෝබර් මස 14 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2016 සැප්තැම්බර් මස 15 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු ඇබෑර්තු

## හක්මණ ප්‍රාදේශීය සභාව

හක්මණ ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සුදුසුකම් සපුරා ඇති අවුරුදු 18 ට වැඩි අවුරුදු 45 ට අඩු හක්මණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියනගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01. | පුස්තකාල සහායක | 01 | (03/2016) රා.ප.ච.ලේ. අනුව පී එල් 1/2016 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් 06 කින් සමත්ව තිබිය යුතුයි. |
| 02. | වැඩ/ක්ෂේත්‍ර කම්කරු | 02 | (03/2016) රා.ප.ච.ලේ. අනුව පී එල් 1/2016 | අවම වශයෙන් 8 ශ්‍රේණිය/9 වසර සමත් වීම. |

රු. 24250 - 10x250 -
10x270 - 10x300 -
12x330 - රු. 36,410
(ඉහත සඳහන් වැටුප් ව්‍යුහය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 වැනි දින සිට වේ.)

01. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
02. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
03. තෝරාගනු ලබන සේවක සේවිකාවන් අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.
04. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසි හා මුදල් රෙගුලාසි වලටද දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ දකුණු පළාත් රාජ්‍ය සේවයේ හෝ රජයේ දෙපාර්තමේන්තුව හෝ හක්මණ ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝග වලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.
05. පත්වීම ලැබීමෙන් පසු අවුරුදු 03 ක කාලයකදී ස්ථිර කිරීම සම්බන්ධයෙන් සලකා බැලේ.

*ඉල්ලුම් කළ යුතු ආකාරය* .- මෙහි පහත සඳහන් කර ඇති ආදර්ශ ආකෘතිය පරිදි "12x8" ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත් සකස්කර 2016.10.28 වැනි දිනට පෙර "ලේකම්, හක්මණ ප්‍රාදේශීය සභාව, හක්මණ" යන ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය. කඩදසියේ වම්පස උඩ කෙළවරේ අදාළ තනතුරේ නම සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව එවනු ලබන අයදුම්පත්‍රද, අසම්පූර්ණ අයදුම්පත්‍රද ප්‍රතික්ෂේප කරනු ලැබේ. දැනටමත් රාජ්‍ය සේවයෙන් හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

අයදුම් පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතු වේ.

01. උප්පැන්න සහතිකය,
02. අධ්‍යාපන සහතික,
03. හැඳුනුම්පතෙහි පිටපතක්,
04. පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනු අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය,
05. වසර 03 කට වැඩි පළපුරුද්ද සම්බන්ධ සේවා සහතිකය,
06. මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක්.

*බඳවා ගැනීමේ ක්‍රමය .–*

1. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක හා වෘත්තීය ප්‍රවීණතාව තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වේ.)

2. මෙම අයදුම්පත් කැඳවූ පසු හෝ කැඳවන අතරතුරේදී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීමේ හෝ වෙනස් කිරීමේ හෝ අවලංගු කිරීමේ බලය හක්මණ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු වේ.

එන්. එම්. පී. ජී. අබේවික්‍රම,
ලේකම්,
හක්මණ ප්‍රාදේශීය සභාව.

2016 සැප්තැම්බර් මස 19 වැනි දින,
හක්මණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

හක්මණ ප්‍රාදේශීය සභාවේ ..............................................................තනතුර සඳහා වූ අයදුම් පත්‍රය

01. මුලකුරු සමග නම - ..................................................................................................
02. මුලකුරුවලින් හැඳින්වෙන නම - ........................................................................................................
03. පෞද්ගලික ලිපිනය - .........................................................................................................
04. උපන් දිනය :
*(අ)* අවුරුද්ද ............. මාසය ..................... දිනය .................
*(ආ)* 2016.10.28 වැනි දිනට වයස : අවුරුදු ................ මාස ......... දින ......
05. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක්ද එසේ නම් පරම්පරාවෙන්ද? ලියා පදිංචි වීමෙන්ද ? ...................................
06. ස්ත්‍රී/පුරුෂ භාවය - ..................................................................................................
07. විවාහක/අවිවාහක බව - ......................................................................................................
08. සමත්ව ඇති ඉහළ විභාගය - ........................................................................................................
09. ශිල්පීය නිපුණතා - ...............................................................................................................
10. වෘත්තීය සුදුසුකම් - .............................................................................................................
.................................................................................................................
11. ඔබට උසාවියෙන් දඬුවම් පවරා තිබේද - ......................................................................................................
12. එසේ නම් දඬුවම් ස්වභාවය - .............................................................................................................
13. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳව විස්තර -
...................................................................................................................................................................................................

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බවට මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දන්වමි.

................................................
අයදුම්කරුගේ අත්සන.

දිනය ..................................................................

10-130

# පළාත් පාලන නිවේදන

## හොරණ නගර සභාව

### 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය.

255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 184 ''අ'' වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 6 දරන පළාත් පාලන ආයතනය සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව වර්ෂ 2016 ක් වූ සැප්තැම්බර් මස 15 වැනි දින අංක 566 යටතේ පහත සඳහන් තීරණය ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සාදන ලදුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1886/46 හා 2014.11.14 වැනි දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථාව, 1989 අංක 12 දරන පළාත් සභා ආනුෂංගික විධිවිධාන පනතේ 2 වන වගන්තියෙහි වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලදුව ඒ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947/7 හා 2015.12.28 වැනි දිනැති *ගැසට් පත්‍රය* යටතේ නිවේදනය කර ඇත.

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව එකී සම්මත අතුරු ව්‍යවස්ථා අතුරින් පහත සඳහන් සම්මත අතුරු ව්‍යවස්ථා හොරණ නගර සභා බල ප්‍රදේශය සඳහා 2017.01.01 වැනි දින සිට අදාළ විය යුතු බවට 255 අධිකාරය වන නගර සභා ආඥාපනතේ 184 'අ' වගන්තිය යටතේ තීරණය කරමි.

1. සැරසිලි විධිමත් කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව
2. බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
3. පීඩාකාරී ව්‍යාපාර, අන්තරායදායක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

4. හෝටල් හා ලැගුම්හල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
5. අදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
6. භෝජනශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
7. මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
8. සභා බල ප්‍රදේශයෙහි මාර්ගවල වාහන පාලනය කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව
9. සංචාරක වෙළෙඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව
10. ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
11. සේවා සඳහා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
12. ක්‍රීඩාභූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
13. මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
14. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

තවද මෙම තීරණය ගනු ලබන මෙදින වන විට හොරණ නගර සභා බල ප්‍රදේශ සඳහා 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ විස්තර කරන සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ එතෙක් ගනු ලබන ක්‍රියාමාර්ගයන්ට අගතියක් නොවන පරිදි 2016.12.31 වැනි දිනෙන් පසුවට හොරණ නගර සභා බල ප්‍රදේශය සඳහා අදාළ නොවිය යුතු බවට 255 අධිකාරය වන නගර සභා ආඥා පනතේ 184 'අ' වගන්තිය යටතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව තීරණය කරමි.

උපලේඛනය

* බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
* භෝජනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
* භෝජනශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
* ලැගුම්හල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
* අප්‍රිය වූද, අන්තරායදායක වූද කර්මාන්ත පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
* මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
* මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

ලේකම් හා බලතල, කාර්ය, කර්තව්‍ය,
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
හොරණ නගර සභාව.

2016 සැප්තැම්බර් මස 19 වැනි දින,
හොරණ නගර සභාවේ දී ය.

10-143

---

## දොම්පෙ ප්‍රාදේශීය සභාව

### 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9.3 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වන වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව වර්ෂ 2016 ක් වූ අගෝස්තු මස 18 වැනි දින අංක 216 යටතේ පහත සඳහන් තීරණය ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සාදන ලදුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1888/47 හා 2014.11.14 වැනි දින දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා, 1989 අංක 12 දරන පළාත් සභා ආනුශංගික විධිවිධාන පනතේ 2 වැනි වගන්තියෙහි වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලදුව ඒ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947/6 හා 2015.12.28 වැනි දිනැති *ගැසට් පත්‍රය* යටතේ ඇති සහ අංක 1976/21 හා 2016.07.20 වැනි දිනැති *අති විශේෂ ගැසට් පත්‍ර* යටතේ නිවේදනය කර ඇත.

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව එකී සම්මත අතුරු ව්‍යවස්ථා දොම්පෙ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය සඳහා 2017.01.01 වැනි දින සිට අදළ විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය යටතේ තීරණය කරමි.

තව ද මෙම තීරණය ගනු ලබන මෙදින වන විට දෙම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වැනි වගන්තිය යටතේ අදාළ කර ගනිමින් බලාත්මක වන පහත උපලේඛන ගත නාමයන් යටතේ විස්තර කරන ලද සම්මත අතුරු ව්‍යස්ථා, එම සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ එතෙක් ගනු ලබන ක්‍රියාමාර්ගයන්ට අගතියක් නොවන පරිදි 2016.12.31 වැනි දිනෙන් පසුවට දොම්පෙ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා අදාළ නොවිය යුතු බවට ද, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය යටතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව තීරණය කරමි.

අංක 11 දරන ලැගුම් නිවාස අතුරු ව්‍යවස්ථාව
අංක 14 දරන හෝටල් අතුරු ව්‍යවස්ථාව
අංක 15 දරන බත් කඩ, ආපනශාලා සහ තේ හෝ කෝපි කඩ අතුරු ව්‍යවස්ථාව
අංක 16 දරන බේකරි අතුරු ව්‍යවස්ථාව
අංක 19 දරන මාළු විකිණීම අතුරු ව්‍යවස්ථාව
අංක 20 දරන මස් විකිණීම අතුරු ව්‍යවස්ථාව
අංක 21 දරන අප්‍රසන්න හා අන්තරාදායක වෙළෙඳාම අතුරු ව්‍යවස්ථාව
අංක 28 දරන සංචාරක වෙළෙන්දෝ අතුරු ව්‍යවස්ථාව
අංක 39 දරන ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය අතුරු ව්‍යවස්ථාව

එම්. යූ. ආර්. මද්දුමගේ,
ලේකම් හා බලතල, කාර්ය, කර්තව්‍ය,
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
දොම්පෙ ප්‍රාදේශීය සභාව.

2016 අගෝස්තු මස 18 වැනි දින,
දොම්පෙ ප්‍රාදේශීය සභාව,
ප්‍රධාන කාර්යාලය - කිරිඳිවැල.

10-65

## හොරණ ප්‍රාදේශීය සභාව - කනන්විල

### 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 9.3 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වැනි වගන්තිය යටතේ සඳහන් විධිවිධාන අනුව වර්ෂ 2016 ක් වූ සැප්තැම්බර් මස 20 වැනි දින අංක 4614 යටතේ පහත සඳහන් තීරණය ගන්නට යෙදුණු බව මෙයින් නිවේදනය කරමි.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ බස්නාහිර පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සාදන ලදුව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1888/47 හා 2014.11.14 වැනි දින දරන අති විශේෂ *ගැසට් පත්‍රයේ* පළකරන ලද කෙටුම්පත් අතුරු ව්‍යවස්ථා, 1989 අංක 12 දරන පළාත් සභා ආනුශංගික විධිවිධාන පනතේ 2 වැනි වගන්තියෙහි වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කරන ලදුව ඒ බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1947/6 හා 2015.12.28 වැනි දිනැති *ගැසට් පත්‍රය* යටතේ නිවේදනය කර ඇත.

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තිය යටතේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව එකී සම්මත අතුරු ව්‍යවස්ථා, හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2017.01.01 වැනි දින සිට අදළ විය යුතු බවට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය යටතේ තීරණය කරමි.

තව ද, මෙම තීරණය ගනු ලබන මෙදින වන විට හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 3 වැනි වගන්තිය යටතේ අදළ කර ගනිමින් බලාත්මකවන පහත උපලේඛනගත නාමයන් යටතේ විස්තර කරන සම්මත අතුරු ව්‍යවස්ථා එම සම්මත අතුරු ව්‍යවස්ථා යටතේ එතෙක් ගනු ලබන ක්‍රියාමාර්ගයන්ට අගතියක් නොවන පරිදි 2016.12.31 වැනි දිනෙන් පසුවට හොරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා අදළ නොවිය යුතු බවට ද 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය යටතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව තීරණය කරමි.

අනෝමා අබේසිංහ,
ලේකම් හා බලතල, කාර්ය, කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී,
හොරණ ප්‍රාදේශීය සභාව.

2016 සැප්තැම්බර් මස 20 වැනි දින,
හොරණ ප්‍රාදේශීය සභාව,
කනන්විල ප්‍රධාන කාර්යාලය.

**ඉහත කී උපලේඛනය**

1. සැරසිලි විධිමත් කිරීම සඳහා වන අතුරු ව්‍යවස්ථාව
2. බේකරි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
3. පීඩාකාරී ව්‍යාපාර, අන්තරායදයක ව්‍යාපාර හා පීඩාකාරී හා අන්තරායදයක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
4. හෝටල් හා ලැගුම්හල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
5. ආදහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
6. භෝජනශාලා පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
7. මාළු විකිණීම පිළිබඳ අතුරු ව්‍යස්ථාව
8. සභා බල ප්‍රදේශයන්හි මාර්ගවල වාහන පාලනය කිරීම සඳහා වූ අතුරු ව්‍යවස්ථාව
9. සංචාරක වෙළෙඳාම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
10. ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
11. ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
12. සේවා සඳහා ගාස්තු අයකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
13. ක්‍රීඩා භූමි පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
14. මස් විකිණීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
15. අවමංගල්‍ය සේවා සැපයුම් ස්ථාන පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

10-119

---

## ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව —නාඋල ප්‍රාදේශීය සභාව නිවේදනය

### 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

261 වැනි අධිකාරියවන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව පහත සඳහන් තීරණය මෙයින් නිවේදනය කරනු ලබයි.

**තීරණය**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වැනි අධිකාරිය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මධ්‍යම පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පළාත් පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2013.06.28 දින අංක 1816/42 දරන ශ්‍රී ලංකා ප්‍රජාතින්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (අ) කොටසේ පළකරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දා වූ ඝන අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මෙම තීරණය ශ්‍රී ලංකා ප්‍රජාත්න්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පල කරනු ලබන දින සිට නාඋල ප්‍රදේශීය සභා බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 09(03) උප වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මෙයින් තීරණය කරමි.

පී. පී. මාලිනි සෙනෙවිරත්න,
ලේකම්,
නාඋල ප්‍රදේශීය සභාව.

2016 සැප්තැම්බර් මස 21 වැනි දින,
10-144

## රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත සඳහන් නියමය කිරීමට තීරණය කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩී. ජී. සීලවතී,
ලේකම්,
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව.

2016 අගෝස්තු මස 31 වැනි දින.

තීරණය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වැනි වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, රිදීමාලියද්ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වරිපනම් කාර්යය සඳහා යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය සඳහා සහ හෝ අක්කර බද්දේ කාර්යය සඳහා යම් වගාකළ ඉඩමක විශාලත්වය තක්සේරු කිරීම සඳහා එකී යම් දේපලක අයිතිකරුට සහ පදිංචිකරුට එහි කුලිය හෝ වාර්ෂික වටිනාකම හෝ එහි විශාලත්වය පිළිබඳ වාර වාර්තා සපයන ලෙස නියම කළ යුතු යැයි, එකී පනතේ 9 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියෙන්, එකී ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මම මෙයින් තීරණය කරමි.

10-93

---

## වඩමාරච්චි දකුණ / බටහිර ප්‍රාදේශීය සභාව - කරවෙඩ්ඩි

1975 අංක 17 දරන පනතේ කම්ටු අයිතිය ලබාදුන් පනත සහ 1987 අංක 38 දරන පනතේ සංශෝධනය

පහත ශීර්ෂයේ සඳහන් කර ඇති පුද්ගලයන්ගේ ඉඩමේ ඔහුගේ නමට ඉදිරියෙන් දක්වා ඇති කම්ටුව 2017 වර්ෂයේ පවත්වාගෙන යාමට ඉහත අයිතිය ලබාදෙන පනතේ 06 වැනි වගන්තියට අනුව මෙම ලිපියෙන් දැනුම් දෙමි.

මෙම අයිතිය ලබාගැනීමට යෝජනාකර ඇති කම්ටුව පවත්වාගෙන යාමට තීරණයකර ඇති ඉඩම් අසල පදිංචිකරුවන් කිසිවෙක් මේ සම්බන්ධව විරෝධය පළකරයි නම් ගැසට් නිවේදනය පළකර ඇති දින සිට සති හතරක් ඉක්ම යාමට පෙර ලිඛිත පිටපත් දෙකකින් මා වෙත එවිය යුතු බව දන්වමි.

| *අයදුම්කරුගේ නම හා ලිපිනය* | *කම්ටුවේ සභාපති ද ලේකම් ද, කළමනාකරුද යන වග* | *කම්ටුවේ නම* | *කම්ටුව පවත්වාගෙන යාමට සුදුසු යයි යෝජනා කර ඇති ස්ථානය* |
|---|---|---|---|
| අය්යාතුරෙයි විග්නේෂ්වරන් අයිංකරාප්දි තෙවරයාලි නෙල්ලිඅඩි | කළමනාකරු | අයිංගරන් විනෝදාංශ සමාජය | ප්‍රධාන වීදිය, නෙල්ලිඅඩි, කරවෙඩ්ඩි |

අ. විනෝරාජ්,
ලේකම්.

2016 සැප්තැම්බර් මස 15 වැනි දින,
වඩමාරච්චි දකුණ-බටහිර,
ප්‍රාදේශීය සභාව,
කරවෙඩ්ඩි.

10-03

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු. ශ.* |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | ...137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... | ... 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... | ... 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* | |
|---|---|---|---|
| I වැනි කොටස : | | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 | |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 | |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 | |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 | |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... 00 | | 860 00 | 4 5 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... 00 | | 260 00 | 2 7 5 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 | |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 | |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 | |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ...... | 5,145 00 | 5,520 00 | |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති *උපලේඛනයේ* දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2016**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| **ඔක්තෝබර්** | 2016.10.07 | සිකුරාදා | 2016.09.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.10.14 | සිකුරාදා | 2016.09.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.10.21 | සිකුරාදා | 2016.10.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.10.28 | සිකුරාදා | 2016.10.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **නොවැම්බර්** | 2016.11.04 | සිකුරාදා | 2016.10.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.11.11 | සිකුරාදා | 2016.10.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.11.18 | සිකුරාදා | 2016.11.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.11.25 | සිකුරාදා | 2016.11.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2016.12.02 | සිකුරාදා | 2016.11.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.12.09 | සිකුරාදා | 2016.11.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.12.16 | සිකුරාදා | 2016.12.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.12.23 | සිකුරාදා | 2016.12.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.12.30 | සිකුරාදා | 2016.12.16 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2016 සැප්තැම්බර් මස 15 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.